WARNALEGAL
Justice for all

www.warnalegal.com




- FAMILY LAW
- MIGRATION LAW
- CONVEYANCING
- LITIGATION
- AUSTRALIAN LEGAL ADVICE
- SRI LANKAN LEGAL ADVICE
- COMMERCIAL & BUSINESS LAW
- POWERS OF ATTORNEY & WILLS
- ENGLISH/SINHALESE TRANSLATION & INTERPRETING SERVICE
- SRI LANKAN DEEDS & COMPANY REGISTRATION SERVICE

GUSS DESIGN 03 9769 0099



Madhu Warnakulasuriya LL.B
Solicitor and Barrister
Registered Migration Agent
(MARN 1068979)
Attorney at Law in Sri Lanka



Need Legal Help? Call us Now
03 9792 9977

Australia:
1/44 King Street
Dandenong VIC 3175
0432 480 133
+61 3 9792 9977
+61 3 9701 3718
info@warnalegal.com
warnalegal1

Sri Lanka:
01 Angampitiya Waikkala Sri Lanka
Hotline – 0776 120 008
031 22 72223 031 22 72223
warnalegal2@gmail.com
warnalegal2




## ගෝනුස්සා

සෙන් ආචාර්යවරයෙක් තමන්ගෙ ගෝලයකු සමග ආරාමය අසළ වූ ගඟට යනවා ඇඳුම් සෝදා ගන්නට. ඔවුන් ඇඳුම් සෝදමින් ඉන්නා විට ගං වතුරේ පාව එන ගෝනුස්සකු දකිනවා. ආචාර්ය වරයා වහාම ගඟට බැස ගෝණුස්සා බේරා ගෙන ගොඩින් තියනවා. ඒ අතරේ ගෝණුස්සා ආචාර්යවරයාගේ අතට විදිනවා වේදනාවක් ආවත් ආචාර්ය වරායා ඒ ගැන තැකීමක් නොකරම නැවත තමන්ගේ රෙදි සේදීම පටන් ගන්නවා.

මේ අතරේ ගං ඉවුරේ ඇවිදිමින් සිටින ගෝණුස්සා නැවත වතුරට වැටෙනවා. ආචාර්යවරයා වහා වතුරට බැස දෙවන වතාවටත් ගෝනුස්සා බේරා ගන්නවා. ඒ වතාවේත් ගෝනුස්සා ආචාර්යවරයාගේ අතට විදිනවා.

මේ ඇබැද්දිය බලා සිටි ගෝලයා කතා කරනවා.

"මේ සතා ඔබට නැවත නැවතත් විදිද්දි ඔබ මොකටද මේකාව බේරා ගන්න මහන්සිවෙන්නෙ? දන්නැද්ද විදින එක ගෝණුස්සගෙ ස්වභාවය බව?"

ආචාර්ය වරයා මෙහෙම උත්තර දෙනවා.

"විදින එක ගෝනුස්සගෙ ස්වභාවය... බේරගන්න එක මගේ ස්වභාවය"

**හැම සෙන් කතාවකටම වගේ මේ කතාවටත් තේරුම් රැසක් තියෙනවා. දුෂ්ටයන්ගේ අකටයුතුකම් වලින් හොඳ මිනිසා අධෛර්යයට පත්විය යුතු නැතිය කියන එක තමයි පහසුම තේරුම.**

## ආත්මාභිමානය

ටැන්ග් අධිරාජ්‍යයේ අගමැතිවරයා රාජ්‍ය පාලකයකු ලෙසත් යුද වීරයකු ලෙසත් ප්‍රසිද්ධව හිටියා. ඒ නිසාම ඔහු ජාතික වීරයකු ලෙසත් සැළකුම් ලැබුවා. ධනය බලය කීර්තිය නොඅඩුව තිබුණ අගමැතිවරයා භක්තිමත් බෞද්ධයකු ලෙස ජීවත්වෙන්න උත්සාහ කළා. ඔහු නිතරම සෙන් ආරාමයකට ගියේ එහි සිටි ආචාර්යවරයාගෙන් යම් යම් දේ ඉගෙනගන්න. ඒ ආචාර්යවරයා හා අගමැති අතර තිබුණෙ ලොකු හිතවත් කමක්. ඒ වුණත් අගමැතිවරයාගේ තනතුරේ උසස් බව ඔවුන්ගෙ ගුරු ගෝල සම්බන්ධයට කිසිම බලපෑමක් කළේ නැහැ. බුද්දිමත් ගුරුවරයකු සහ භක්තිමත් ගෝලයකු ලෙස ඔවුන්ගෙ ඇසුර පැවතුණා.



එක් දවසක සුපුරුදු ලෙද සෙන් ආරා මයට ආ අගමැතිවරයා ගුරුතුමාගෙන් ප්‍රශ්නයක් ඇසුවා.

"ගෞරවණීය ඇදුරුතුමනි.. බුදු දහම අනුව ආත්මාභිමානය පැහැදිළි කරදෙන්නෙ කොහොමද?"

ආචාර්යවරයාගේ මුහුණ කෝපයෙන් රතුවුණා. ඔහු ඉතා පහත් බැල්මක් අගමැතිවරයා දෙස හෙලුවා. පහත් බසින් අගමැතිවරයාට කෑගැසුවා.

"ගොන් බූරුවා.. මොන තරම් ගොන් ප්‍රශ්නයක්ද ඒ උඹ දැන් මගෙන් ඇහුවෙ?"

ඒ අනපේක්ෂිත ප්‍රතිචාරයෙන් අගමැතිවරයාගේ මුහුණ රතු වුණා. ඔහු කෝපයෙන් වෙව්ළන්න පටන් ගත්තා. අත මිට මෙළවුණා.

සෙන් ආචාර්යවරයා සිනාසුණා.
"ගරු අගමැතිතුමනි.. ඔන්න ඕකට තමයි ආත්මාභිමානය කියන්නෙ"

**සමහර කරුණු කාරණා වචනවලින් කියා දෙනවාට වඩා සාර්ථකව ක්‍රියාවෙන් පෙන්වා දෙන්න පුලුවන්.**

ජගත්